පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂයः කතෝලික ධර්මය

සතිය - 04

ශ්‍රේණිය 08

Prepared by - Sunil Perera

# සාන්තුවර බැතිය - 19 වන පාඩම

## (පිටු අංක 75,76,77)

**<u>ශුද්ධවූ අන්තෝනි මුනිතුමා</u>**

(ශුද්ධවූ අන්තෝනි මුනිතුමා ගැන එතුමාගේ ජීවිත කථාවෙන් ගත් සාරාංශයක් ඔබගේ දැන ගැනීම හා ඔබගේ ජීවිතයට යහපත් ආදර්ශයක් ගැනීම සඳහා පහතින් දක්වමු.)

- ශුද්ධවූ අන්තෝනි මුනිතුමා උපන්නේ වර්ෂ 1195 දෙව් මව්න්ගේ ස්වර්ගාරෝපිත මංගල දිනය වන අගෝස්තු 15 වැනිදාය.

- එතුමාගේ පියා පෘතුගාලයේ ලිස්බන් නගරයේ ආණ්ඩුකාරයා වූ මාටින්ද බෝලියන්ය. මව තෙරේසා, ඕස්ට්‍රියාවේ රජ පෙලපතකට අයත් කාන්තාවක් වූවාය.

- එතුමා "ෆර්නැන්ඩෝ" නමින් ප්‍රසාද ස්නාපනය ලබන දිනයේ දී එතුමාගේ මව එතුමාව කන්‍යමරිය තුමියට කැප කළාය.

- එතුමාගේ ළමා කාලයේ දී එතුමාට නොයෙක් ආකාරයේ දුරපරීක්ෂා, පැමිණි අතර, එතුමා යක්ෂයාගේ බලවේගයන්ට විරුද්ධව එඩිතරව සටන් කළේය.

- එතුමා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ලොකු භක්තියක් දැක්වූවේය. එයින් එතුමාට පැමිණි දුර පරීක්ෂා වලින් ජය ගන්නට ශක්තිය ලැබුවේය.

- එතුමා මූලික අධ්‍යාපනය ලැබුවේ ආසන දෙව් මැදුරේ පාසැලකයි. පසුව වර්ෂ 1210, එතුමාට වයස අවුරුදු 15 වූ විට එතුමා ලිස්බන් නගරයට ආසන්න අගුස්තීනියානු අධ්‍යාපන ආයතනයකට ඇතුළු වී කැනන් රෙගියුලර් නිකායට බැඳීමෙන් පසුව, තම පියාණන්ගෙන් උරුම වන ගෞරව නාම හා ධනය ප්‍රතික්ෂේප කර පූජක තුමෙකු වීමට තීරණය කළේය.

- එම නිකායේ අවුරුදු 10ක් ගත කර, අවුරුදු 02ක් සාන්ත වින්සන් ආයතනයෙන් අවුරුදු 8ක් එකල සුප්‍රසිද්ධ කොයිම්බ්‍රාහි ශුද්ධවූ කුරුසියේ තාපසාරාමයක් වන උසස් අධ්‍යාපන ආයතනයට බැඳී ශුද්ධවූ ලියවිල්ල හා සභා ඉගැන්වීම හැදෑරුවේය.

- ඉන්පසු එතුමා ප්‍රාණපරිත්‍යාගිවරයෙකු වීමට වර්ෂ 1220 දී කොයිම්බ්‍රාවේ පිහිටි ශුද්ධවූ අන්තෝනි වනගත තාපසතුමාගේ නමට කැප කර තිබූ තාපසාරාමයේදී ප්‍රැන්සිස්කානු තාපස ඇඳුම ලබා එතුමා එහිදී "අන්තෝනි" යන නමද ලබා ගත්තේය.

- වර්ෂ 1222 දී එතුමා දේශකයෙක් ලෙස කටයුතු කරමින්, ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය දක්වා කීකරු වීම ගැන ඉතා චතුර ලෙස දේශනා කලේදයත්, එම දේශනා ඇසූ සියල්ලෝ මවිත වූහ. තම සරල ජීවිත ක්‍රමය හා දේශනා ක්‍රමය මගින් බොහෝ දෙනෙකුගේ සිත් හරවා ගැනීමට එතුමාට හැකි විය.

- වර්ෂ 1224 දී දකුණු ප්‍රංශයේ වේද භාරකරුවන් හරවා ගැනීම සඳහා එතුමාව යවන ලදී. එතුමා සතුව තිබූ මහත් දයාව උගත්කම ගැඹුරු ශුද්ධවන්තකම නිසා බොහෝ දෙනෙකුගේ සිත් හරවා ගැනීමට එතුමාට හැකිවිය.

- එතුමා තරම් දක්ෂ දේශකයෙකු එවකට සිටියේ නැත. එතුමාගේ දේශනා ඇසීමට කොතරම් ජනතාවක් පැමිණියද කීවොත් දෙව් මැදුර, එසේම නගර සභා පිට්ටනිය ජනතාවට ඉඩ නොමැතිව එතුමා දේශනා කළ වේදිකාව ගමට ද ගෙන යන්නට සිදු වුණා. එතුමා දේව ධර්මාචාරවරයෙකු ලෙස කටයුතු කළා.

- එතුමා මිනිසුන්ගේ ශාරීරික හා අධ්‍යාත්මික උවමනා ඉටුකර දුන්නා පමණක් නොව ආබාධිතයින් කිහිපදෙනෙක් සුවපත් කල බවට පරම්පරාගත කතා වලින් කියැවේ. එතුමා දිළිඳුන්ට බොහෝ ආදරය කලා ඔවුනට ආහාර දුන්නා. රෝගීන් සුවපත් කලා. එතුමා මිය ගිය දරුවෙකුට ප්‍රාණය දුන් බවට සඳහන් වෙනවා.

- දිනක් එතුමා තම කාමරයේ යාච්ඤා කරමින් සිටින විට හදිස්සියේම දීප්තිමත් අලෝකයක් තුලින් සිනහමුසු මුහුණින් සිටින ජේසු බිළිදාව දුටුවා පමණක් නොව බිළිඳු ජේසු උන්වහන්සේගේ බොළඳ දෑතින් එතුමාව වැළඳ ගත්තා. මෙම සිද්ධිය සිහිවීම පිණිස එතුමාගේ ප්‍රතිමාවෙහි ශුද්ධවූ බයිබලය මත අසුන්ගෙන සිටින ජේසු බිළිඳුන් තමන්ගේ දෑතින් එතුමා ආදරයෙන් ඔසවාගෙන සිටින අතර එතුමාගේ නිර්දෝෂිභාවයේ සලකුණක් ලෙස ලීලී මලක් එතුමාගේ අතේ රඳවා ගෙන ඇත.

- අසිසියේ ශුද්ධවූ ප්‍රැන්සිස් මුනිතුමාගෙන් ආදර්ශය ලබාගත් ශුද්ධවූ අන්තෝනි මුණිතුමා දේව මෑණියන් කෙරෙහි තිබූ මෘදු ප්‍රේමය, එතුමාගේ විශේෂ ගුණාංගයක් විය. එතුමාගේ දක්ෂ දේශනා මගින් දේවමාතා භක්තිය මිනිසුන්ගේ හදවත් තුළ ජනිත කරවීමට බොහෝ උත්සාහ කළා.

- එතුමා දේව මෑණියන්ගේ ස්වාර්ගාරෝපිත මංගල්‍යය දින ඉපදී, මරියතුමියට කැප කළ දේවස්ථානයක ප්‍රසාද ස්නාපනය ලබා එතුමාගේ මරණින් පසු එතුමාගේ මෘත දේහය තැන්පත් කරනු ලැබුවේ ද දේව මෑණියන්ට කැප කළ පාදුවාහි දේවස්ථානයකය.

- එතුමා යාච්ඤා කරමින් තම අවසාන කාලය ගත කරමින් සිටිය දී වර්ෂ 1231 දී 13වන දා එතුමා රෝගාතුර වී පාදුවාවට ගෙන යන මගදී අන්තිම ආලේපය ලබා ගෙන "ස්වාමිනි ඔබවහන්සේව පේනවා" කියා දෙවරක් ප්‍රකාශ කර උකුත් වූයේය.

- එතුමා උකුත් වී මාසයක් ගතවන්නට පෙර එතුමාට ශුද්ධවන්තයන්ගේ නාම ලේඛනයට පත් කරන ලෙස පාදුවාවේ ජනතාව 9 වෙනි ග්‍රෙගරි පාප්තුමාගෙන් ඉල්ලා සිටියෝය. එතුමා උකුත් වන්නට පෙර කල ප්‍රාතිහාරය දෙකට අමතරව උකුත් වූ පසු ප්‍රාතිහාර්‍යය 44න් සාක්ෂි ලෙස ලබාගෙන උන්වහන්සේව 1232 මැයි 30 වන දින 9 වෙනි ග්‍රෙගරි පාප්තුමා විසින් ශුද්ධවරයට පත් කළේය. 13 වන ලියෝ පාප්තුමා ශුද්ධවූ අන්තෝනි මුනිතුමා හැඳින්වූයේ " ලෝකයේ සාන්තුවරයා" ලෙසයි. 1946 දී 12 වන පියුස් පාප්තුමා එතුමාව සභාවේ ධර්මාචාරවරයෙකු ලෙස ප්‍රකාශ කළේය. එතුමාගේ මරණින් පසු බොහෝ ප්‍රාතිහාර්‍යයන් සිදු වුණා සේම අදත් ප්‍රාතිහාර්‍යයන් සිදුවන නිසා එතුමා "ප්‍රතිහාර්‍යයන් කරන ශුද්ධවන්තයා" කියා ජනතාව හඳුන්වනු ලබනවා.

- එසේම එතුමා දිළිඳුන්ගේ මිත්‍රයා ලෙසද නැති වූ දේ සොයා දෙන සාන්තුවරයා ලෙසට කතෝලිකයන් මෙන්ම අකතෝලිකයන්ද ඉතා විශාල ආදර භක්තියක් ගෞරවයක් එතුමාට දක්වනවා.

- එතුමා ඉපදී අවුරුදු එක්දාස් විසිපහක් ගතවී ඇතත් තාමත් එතුමා දේශනා කරනවා. අසරණ අයට උදවු උපකාර කරනවා. රෝගීන් හා සිරගත වූවන් බැහැදකිනවා.

ඉතාලියේ පාදුවාහී ඇති එතුමාගේ සොහොන බැහැදැකීමට අවුරුදු පතා ලෝකයේ සෑම දෙසින්ම දහස් ගණන් වන්දනාකරුවන් පැමිණෙනවා.

- වර්ෂ 1263 දී පාදුවාහි ජනතාව එතුමාගේ නමින් බැසිලිකාවක් ගොඩනගා එතුමාගේ ශුද්ධවූ ධාතු එහි තැන්පත් කරනු ලැබුවා. එතුමාගේ මරණින් අවුරුදු 32කට පසු එතුමාගේ මෘත ශරීරය පාදුවාවට ගෙනෙන විට එතුමාගේ දිව පමණක් නොදිරා ඉතිරිව තිබුණා. අදත් එම දිව රතු පාටින් ජීවමානව එහි තිබෙණවා.

(01) ඉහත සඳහන් කරුණු අනුව ශුද්ධවූ අන්තෝනි මුනිතුමාගේ ජීවිතයෙන් ඔබගේ ජීවිතයට ගත හැකි වැදගත් ආදර්ශ මොනවාද?

එතුමා (1) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට දේව මැණියන්ට දක්වූ ආදර භක්තිය මෙන්ම, (2) ක්‍රිස්තු ධර්මය ප්‍රචාරය කිරිමට එතුමා දක්වූ කැපවීම. (3) අසරණ වූ ජනතාව වෙනුවෙන් කැපවීම.

(02) 75 වන පිටුවෙහි සඳහන් ඡේදය හොඳින් කියවා පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(අ) රූප වන්දනාව යනු කුමක්ද?

(ආ) ප්‍රතිමා, රූප හෝ පින්තූර මගින් සිදුවන්නේ කුමක්ද?

(ඇ) ප්‍රතිමා, බොරලික්කම් හෝ වෙනත් පළඳනා ආදිය ගැන අප විශ්වාස නොකල යුත්තේ කුමක්ද?

(ඈ) මේවා ශුද්ධවත් කර ඇත්තේ කෙසේද?

(ඉ) ඒවා පරිහරණය කළ යුත්තේ කෙසේද?

(ඊ) සාන්තුවරු යනු කවුරුන්ද?

(උ) ප්‍රතිමාවකට හෝ රූපයකට හෝ ගරු බුහුමන් දක්වීම තුළින් පිළිඹිබුවන්නේ කුමක්ද?

(ඌ) ප්‍රතිමාවල පරමාර්ථය කුමක්ද?

(එ) දෙවියන් වහන්සේගේ මිත්‍රත්වය දිනා ගත් පුද්ගලයෙකුට ගරු බුහුමන් දක්වීමෙන් අප අදහා ගත යුත්තේ කුමක්ද?

(ඒ) සාන්තුවරුන්ට ගරු කල යුත්තේ කුමක් උදෙසාද?

(ඔ) සාන්තුවරුනට ගරු කල යුත්තේ කෙසේද?

(ඕ) සාන්තුවරුන් තුළින් අපගේ ජීවිත ගොඩනගා ගත හැක්කේ කෙසේද?

(04) අලුත් ගිවිසුමේ ජේසුස් වහන්සේගේ කාලයේදී උන්වහන්සේගේ සළුවට අත ගැසූ ස්ත්‍රියගේ සිද්ධියෙන් අපට උගන්වන කරුණු 02ක් ලියන්න.

(05) පැරණි ගිවිසුමේ ප්‍රතිමා භාවිතා කෙරෙනු අවස්ථා 02ක් ලියන්න. එම ප්‍රතිමා සාදන ලද්දේ කාගේ උපදෙස් අනුවද?

(06) 76 වන පිටුවෙහි සඳහන් නික්මයාම 20:4 පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(අ) එම පාඨය කා විසින් කා හට කියන ලද්දක්ද?

(ආ) එයින් ප්‍රකාශ වන දේව අණ කුමක්ද?

(ඇ) ඊට හේතුව වශයෙන් දෙවි සමිදාණන් වහන්සේ කුමක් ප්‍රකාශ කරන්නේද?

(ඈ) එහි සඳහන් "ප්‍රතිවාදින්" යන වචනයේ තේරුම කුමක්ද?

(ඉ) එම දේව අණ නොපිළිපැද්දොත් ඊට දෙන දඬුවම කුමක්ද?

(ඊ) ශුද්ධවන්තයින් ආදර්ශයක් වන්නේ කා හටද?

(උ) එහිදී පාපයක් වන්නේ කුමන ක්‍රියා වල යෙදිම නිසාද?

(ඌ) ශුද්ධවන්තයින් යනු කවුරුන්ද?

(07) ශුද්ධවන්තයින්ගේ ආදර්ශය අනුව අපට කළ හැකි දෑ මොනවාද? (19 වන පාඩමෙහි ඇති අන්තිම ඡේදයේ සඳහන් කරුණු ලියන්න.)

(08) සාන්තුවර බැතිය ගැන වාක්‍ය 05ක් ලියන්න.

(09) ඔබ කැමති සාන්තුවර ජීවිත කතාවක සාරාංශය ලියන්න.

(10) එම සාන්තුවර ජීවිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ තුනක් ලියන්න.

# දේව නාමයේ ශුද්ධත්වයට ගරු කිරීම. - 20 වන පාඩම

(01) මෙම පාඩමේ සඳහන් නික්මයාම 20:7 පාඨයට අදාල කරුණු

(අ) දෙවියන් වහන්සේ විසින් මොසෙස් මඟින් ඊශ්‍රායෙල් ජනතාවට ප්‍රකාශ කල පනත් 10න් 2වන පණතයි.

(ආ) දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමය නිගරු ලෙස භාවිතා නොකළ යුතු බව පෙන්වා දෙයි.(එනම් දේව නාමය උච්චාරණය කරන විට එය භක්තියෙන් හා ගෞරවයෙන් කළ යුතුය/ ඔවුන් වහන්සේගේ නාමය ගෞරවයෙන් භාවිතා කළ යුතුය)

(ඇ) ආශිර්වාද කිරීමට, ප්‍රශංසා කිරීමට, යාච්ඥා කිරීමට හෝ මහිමයට පත් කිරීමට හැර අනවශ්‍ය ලෙස දේව නාමය උච්චාරණය නොකළ යුතුය.

(02) ප්‍රශ්නය - දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමයට ගරු කළ යුත්තේ ඇයි?

උත්තරය :- 1.උන්වහන්සේ අති ශුද්ධවත්න වන නිසා.

2. උන්වහන්සේගේ නාමය ද අතී ශුද්ධවන්ත නිසා.

(03) එසේ දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමයට ගරු කරමින් උන්වහන්සේ කෙරෙහි විශ්වාස තබන්නන්ට ලැබෙන්නේ කුමක්ද?

උත්තරය : උන්වහන්සේගේ නාමය එළදරව් කරන සේක.

(04) දස පණතේ දෙවෙනි පණතට අදාල පුරාණ ගිවිසුමේ පාඨ 2ක් ලියන්න.

1. ද්විතීය නීති සංග්‍රහයේ 10:20 අනුව උන්වහන්සේගේ නාමයෙන් පමණක් දිවුරුම් දිය යුතුය.

2.ගීතාවලියේ සඳහන් දෙවියන් වහන්සේට අශාවීමේ ගීතිකාවක් වන 63:11 අනුව මුසා දොඩන්නවුන්ගේ මුව පියවෙන විට සමිඳුන් නමින් දිවුරන්නෝ ප්‍රීතිමත් වන්නෝය.

(05) ඉහත පාඨ දෙකෙන් පැහැදිලි වන්නේ කුමක්ද?

උත්තරයඃ පුරාණ ගිවිසුමේ දිවුරුම අනුමත කර ඇති බව.

(06) ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් වල දිවුරුම් දීම සම්බන්ධයෙන් මතෙව් 5:34-37 පාඨය අනුව ප්‍රකාශ කළේ කුමක්ද?

(අ) කොහෙත්ම නොදිවුරන්න.

(ආ) ස්වර්ගය දෙවියන් වහන්සේගේ සිංහාසයනය බැවින් ඒ නමින්වත් නොදිවුරන්න.

(ඇ) පොළොව දෙවියන් වහන්සේගේ පා පුටුව බැවින් ඒ නමින් වත් නොදිවුරන්න.

(ඈ) ජෙරුසලම මහ රජුගේ රාජධානිය වන බැවින් එනමින්වත් නොදිවුරන්න.

(ඉ) එක හිස කෙසක් සුදු කර ගන්න හෝ කළු කර ගන්න හෝ ඔබට නුපුළුවන් බැවින් හිස නමින්වත් නොදිවුරන්න.

(ඊ) ඔබේ අදහස එසේය කීම නම් එසේය කියා ද නැත කීම නම් නැත කියාද වේවා ඊට වැඩි යමක් ඇද්ද එය එන්නේ නපුරාගෙන්ය.

පළමු පිටුව

(07) මෙම ශුද්ධ ලියවිලි පාඨයෙන් අපට පෙන්වා දෙන්නේ කුමක්ද?
උත්තරය : දිවුරීම ක්‍රිස්තුස් වහන්සේ තරයේම හෙළා දකින බවය.

(08) දිවුරුම ගැන පාවුලු තුමාගේ ඉගැන්වීම කුමක්ද?
උත්තරය : 1. එතුමා කොරින්තිවරුනට යවන ලද 2වන ලිපියේ 1:23 අනුව එතුමා කොරින්තියට නොගියේ කොරින්නිවරුන්ට ඇති අනුකම්පාව නිසා එතුමාගේ හද පත්ලෙන් දිවුරමින් දෙවියන් වහන්සේ එතුමාගේ සාක්ෂිකරු වශයෙන් කැඳවන බව.
2. එතුමා ගලාතිවරුන්ට යවන ලද ලිපියේ 1:20 අනුව එතුමා ලියන සෑම දෙයක්ම සැබෑ බව දෙවියන් වහන්සේ ඉදිරියේ සහතික කර තියෙන බවයි.

(09) මෙම පාඨ වලින් පැහැදිලි කරන්නේ කුමක්ද?
උත්තරය: පාවුලු තුමා දිවුරුම අනුමත කරන බවයි.

(10) දිවුරුම පිළිබඳ ශුද්ධවූ සභාවේ ඉගැන්වීම් මොනවාද?
උත්තරය :1. නීතිය ඉදිරියේ තමන් පවසන දේ සත්‍යය බව දන්නෙහි නම් එවන් අවස්ථාවක දිවුරිය හැකි වේ.
2. බොරු පොරොන්දු දීම දෙවන පනතට විරුද්ධ පාපයකි.
3. දස පනතේ අටවන පනත වන "බොරු සාක්ෂි නොකියව" යන පනතට අනුව ද බොරු කීම පාපයකි.
4. යම් දෙයක් නොදන ඒ පිළිබඳව සාක්ෂි දුරීම දේව පනතට විරුද්ධය.

**<u>බාරහාර සම්බන්ධව ශුද්ධවූ සභාවේ ඉගැන්වීම් මොනවාද?</u>**

(1) බාරයක් යනු කුමක්ද?
උත්තරය: දෙවියන් වහන්සේට ප්‍රසන්න අමතර යමක් කරන්නට ස්වකීය කැමැත්තෙන්ම දෙන පොරොන්දුවකි.

(2)බාරහාර සම්බන්ධයෙන් ශුද්ධවූ සභාවේ ඉගැන්වීම් කුමක්ද?
උත්තරය: 1.බාරයක් විය යුත්තේ පුර්වයෙන් ඒ පිළිබඳව හොඳින් සිතා මතාය.
2. බාරයක් කඩ කිරිම බරපතල වරදකි.

(3) බාරයක් නොවීම සම්බන්ධයෙන් ද්විතීය නීති සංග්‍රහයේ සඳහන් වන්නේ කුමක්ද?
උත්තරය: ද්විතීය 23:22 අනුව බාරයක් නොවීම පාපයක් නොවන බවය.

(4) වර්තමානයේදී බාරය පත්වී ඇත්තේ කුමකටද?
උත්තරය: ගනුදෙනුවක් නැතිනම් අල්ලස් දීමක් බවට(එනම් ඔබ යමක් දෙන්නේ නම් මමත් ඔබට යමක් දෙමි)

(5) බාරහාර යනු කුමක්ද?
උත්තරය: 1. දෙවියන් වහන්සේ සමග කරන ගනු දෙනුවක් නොවේ.
2. දෙවියන් වහන්සේගේ අයිතිය දෙවියන් වහන්සේට පවරා දිමකි.
3. මෙය උත්තරීය ආකල්පයකි.

(6) බාර ඔප්පු කිරීමේදී ඔප්පු කරන්නාගේ ආකල්පය වැදගත් වන්නේ කෙසේද?
උත්තරය: 1. යම් පුද්ගලයෙකුට දෙවියන් වහන්සේ ලබාදුන් දෙයකට හද පත්ලෙන්ම කළගුණ සැලකීමකි.
2. ප්‍රීතිය පළ කිරීමකි.
3. ප්‍රශංසා කිරීමකි හෝ විශ්වාසය ප්‍රකාශ කිරීමකි.

(07) දිවුරුම හා බාරහාර සම්බන්ධයෙන් අපට කළ හැකි දෑ මොනවාද?
උත්තරය : 1. දේව නාමය ගෞරවයෙන් භාවිතා කරන්න.

2 අප අන් අයට දුන් පොරොන්දු ඉටුකර ඒවාට විශ්වාසය පක්ෂ විය යුතුය.

ක්‍රියාකාරකම් - පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(01) දස පණතේ දෙවන පණත ලියන්න.

(02) එම පණත අනුව අප කළයුතු හා නොකළ යුතු දේ මොනවාද?

(03) දිවුරුම් දීම සම්බන්ධයෙන්

අ) පුරාණ ගිවිසුමේ සඳහන් වන්නේ කුමක්ද?

ආ) ජේසුස් වහන්සේගේ ඉගැන්වීම කුමක්ද?

ඇ) පාවුලුතුමාගේ ඉගැන්වීම කුමක්ද?

ඈ) වර්ථමාන ශුද්ධවූ සභාවේ ඉගැන්වීම කුමක්ද?

(04) අ) බාරයක් යනු කුමක්ද?

ආ) බාරහාර යනු කුමක්ද?

ඇ) බාරහාර සම්බන්ධයෙන් ශුද්ධවූ සභාවේ ඉගැන්වීම් කුමක්ද?

(05) බාර ඔප්පු කිරීමේදී ඔප්පු කරන්නාගේ ආකල්පය වැදගත් වන්නේ කෙසේද?

(06) දිවුරුම හා බාරහාර සම්බන්ධයෙන් අපට කළ හැකි දේ මොනවාද?

## ඉරුදින ශුද්ධවන්තව ගත කිරීම. - 21 වන පාඩම

(01) නික්මයාම 31:15 අනුව සබත් දිනය යනු කුමක්ද?

(02) සබත් දිනය වැටෙන්නේ සතියේ කිනම් දිනකද?

(03) සබත් දිනය නිවාඩු දිනයක් වීමට හේතු වූ කරුණ කුමක්ද?

(04) සබත් දිනය මනුෂ්‍යයා ගත කළ යුත්තේ කෙසේද?

උත්තරය : අ) නිවාඩු දිනයක් විය යුතුය.

ආ) විශ්වය මවා අපට ගැලවීම දිනාදුන් දෙවියන් වහන්සේ වෙනුවෙන් එදින ගත කළ යුතුය.

ඇ) එම දිනය වෙනත් දිනවලට වඩා ධර්මානුකූලව ගත කළ යුතුය.

ඈ) දෙවියන් මුල් කර ගෙන ජීවත් වන මනුෂ්‍යයා දේව වන්දනාවේ හා යහපත් ක්‍රියාවන්හි නිරත විය යුතුය.

(05) මෙදින කිතුනුවෝ සිදුකරන්නේ කුමක්ද?

(06) මෙදින සිදු කරන වන්දනාවේ උල්පත හා මුදුන්කඩ වන්නේ කුමක්ද?

(07) ජුදා සම්ප්‍රදායේ සබත් දින සිදුවූයේ කුමක්ද?

(08) මෙම සම්ප්‍රදායට නව ගිවිසුමේ ගරු කරමින් කටයතු කළේ කවුරුන්ද?

(09) මේ සම්බන්ධයෙන් මාක් 6:1-6 ඡේදයේ සඳහන් සිද්ධිය ලියන්න.

(10) එදා සබත් දින වෙනුවට වර්තමානයේ දෙවිඳුන්ට කැපකර ඇති දිනය කුමක්ද?

(11) එදිනට දෙවි පියාණන් වහන්සේ අප එනතුරු බලා සිටින්නේ කුමක් සඳහාද? කුමන ස්ථානයට එන්නේ දැයි බලා සිටින්නේද?

(12) අලුත් ගිවිසුමේ ඉරුදින සිදුවූ විශේෂ සිද්ධීන් 06ක් ලියන්න.

(13) සබත් දින හෙවත් ඉරුදින වැදගත් බව සඳහන් වන දේව පණත කුමක්ද?

(14) නික්මයාම 20:8-10 අනුව සබත් දවස ගැන ප්‍රකාශ කරන්නේ කුමක්ද?

(15) එම පණත අනුව අප ඉරුදින ඉටුකළ යුත්තේ කුමක්ද?

(16) එය ඉටු කිරීම සඳහා අප කළ යුතු වන්නේ කුමක්ද?

(17) ඒ කළ යුතු දේ අප කෙසේ ඉෂ්ඨ කළ යුතුද?

(18) මුළු දිව්‍ය පූජාවට සහභාගි වීම යනු කුමක්ද?

(19) ඉරුදින කිතුනු අප අනිවාර්යෙන් කළ යුතු දේ කුමක්ද?

(20) එම කළ යුතු දෙයින් නිදහස් විය හැක්කේ කිනම් අවස්ථාවලදී ද?

(21) එම අනිවාර්ය කළ යුතු දේ සිතා මතා පැහැර හැරීමෙන් සිදුවන්නේ කුමක්ද?

(22) දහම් පාසැල් නොපවත්වන පාසැල් නිවාඩු කාලය ඉරුදින අප කෙසේ ක්‍රියා කළ යුතුද?

(23) ඉරුදින විනෝද චාරිකාවක් ගිය විට කිතුනුවන් අමතක නොකළ යුතු කටයුත්ත කුමක්ද?

(24) ඉරුදින තම ණය යුක්තිය ඉෂ්ඨ කිරීම තුළින් අප පංගුකාරයන් වන්නේ කුමක් සඳහා ද?

(25) ඒ අනුසාරයෙන් අප අලුත් කර ගන්නේ කුමක්ද?

(26) දේව ජනතාවක් ලෙස අපි ශක්තිමත් වන්නේ කුමක් මතද?

(27) ඉරුදින ශුද්ධවත් කිරීම සඳහා කළ හැකි කාර්යයන් 08ක් ලියන්න.

(28) ඉහතින් සඳහන් කරුණු වලින් කිතුනු අපගේ පරම යුතුකම වන්නේ කුමක්ද?

(29) සමිඳුන්ගේ ජය මංගල දිනය වන්නේ කවදාද?

Department of Education Sabaragamuwa Province/ Weekly School Department of Education Sabaragamuwa Province/ Weekly School

# දේව වන්දනාව(ජන වන්දනාව) - 22 වන පාඩම

(01) දේව වන්දනාව නොහොත් ජන වන්දනාව යනු කුමක්ද?

(02) "දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ "යන විශ්ව ලේඛනයේ අංක 20හි සඳහන් ජන වන්දනාව පිළිබඳව අති උතුම් xii(12) වන පියුස් ශුද්ධෝත්තම පියතුමා අර්ථ කථනය කර ඇත්තේ කුමක්ද?

ආ) එහි හිස වන්නේ කවුරුන්ද?

ඇ) එහි අවයව වන්නේ කවුරුන්ද?

ඈ) එහි හිස හා අවයව අතර සම්බන්ධය(ක්‍රියාකාරකම්) මොනවාද?

ඉ) එමඟින් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපට ආරාධනා කරන්නේ කුමක්ද?

(04) අ)දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ජනවන්දනාව පිළිබඳ ව්‍යවස්ථාවේ අංක 7 විග්‍රහ කරන්නේ කුමක්ද?

ආ) ජනවන්දනාව පිළිබඳ මෙම අරුත ගැන්වීමේ මූලික කරුණක් වන්නේ කුමක්ද?

(05)අ) දේව වන්දනාවේදී අපි සැමදින සහභාගි වන්නේ කුමකටද?

ආ) එයින් සිදු කරන්නේ කුමක්ද?

(06) අ) ජන වන්දනාව වචනයට භාවිතා කරන ඉංග්‍රීසි වචනය කුමක්ද?

ආ) එය කිනම් භාෂාවක වචන වලින් බිඳී එන්නක්ද?

ඇ) එම වචන වල තේරුම කුමක්ද?

ඈ) එම වචන වලින් එකක් වන ලිටුර්ජියා යන වචනය මුල් කාලයේදී හඳුන්වනු ලැබුවේ කුමක්ද?

ඉ) ග්‍රීක සමාජයේ මෙම වචනයට පැවතුනු අර්ථ කථන තුනක් ලියන්න.

(07)අ)ජනවන්දනාව තුළින් අප අදිටන් කර ගත යුත්තේ කුමක්ද?

ආ) ඒ තුළින් අප නිරත විය යුතු දයාවේ සේවාවන් මොනවාද?

(08) පාඩමේ අවසානයේ සඳහන් ක්‍රියාකාරකම් යටතේ ඇති ප්‍රශ්න 04ට පිළිතුරු ලියන්න.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂයෑ කතෝලික ධර්මය | සතිය - 08

ශ්‍රේණිය 08 | Prepared by - Sunil Perera

# දේව වන්දනාවේ ප්‍රධාන අංග - 23 වන පාඩම

(01) 22 වන පාඩමෙන් ඉගෙන ගත් කරුණු අනුව දේව වන්දනාව(ජන වන්දනාව) යනු කුමක්ද?

(02) ජන වන්දනාවේ ප්‍රධාන අංග මොනවාද?

(03)අ) දේව වන්දනාවේ හෙවත් ජන වන්දනාවේ උතුම්ම පිළිවෙත කුමක්ද?
ආ) එම උතුම් පිළිවෙත තුළින් සිදුවන්නේ කුමක්ද?
ඇ) එම උතුම් පිළිවෙතට පංගුකාරයන් වන්නේ කවුරුන්ද?

(04) දිව්‍ය පූජාවේ ප්‍රධාන පිළිවෙත් 2ක කුමක්ද?

(05) දිව්‍ය පූජාවේ දේව වාක්‍ය පිළිවෙතෙන් ප්‍රධාන යැදුම් 08 ලියන්න.

(06) ස්ත්‍රෝතික යාගික පිළිවෙතෙහි ප්‍රධාන කොටස් 07 ලියන්න.

(07) දේව ප්‍රසාද නිධාන යනු මොනවාද?
උත්තරය : උත්ථානව වැඩ සිටින දෙවි සමිඳුන් සම්මුඛ වීම සඳහා ඇතුළතින් අප වෙත දානය කරනු ලබන දේව වරප්‍රසාද බාහිර වශයෙන් සලකුණු වන ආකාරයෙන් ක්‍රිස්තුස් වහන්සේ විසින් ස්ථාපිත කර ඇති සංඥා පිළිවෙත්,
(කෙටියෙන් - අ) දේව වරප්‍රසාද දානය කරනු ලබන
ආ) ක්‍රිස්තුස් වහන්සේ විසින් ස්ථාපිත කර ඇති)

(08) දේව ප්‍රසාද නිධාන කීයද? ඒවා නම් කරන්න.

(09) මෙම සෑම දේව ප්‍රසාද නිධානයක්ම ගලා එන්නේ කුමක් තුළින්ද?

(10) අ) දේව ප්‍රසාද නිධාන වලින් අප කෙසේ ලබාගත යුතුද?
ආ) එසේ ලබා ගන්නා ප්‍රසාධ නිධාන වලින් අපට ලැබෙන්නේ මොනවාද?(කරුණු 02ක් ලියන්න)

(11) අ) යාම යැදුම යනු කුමක්ද?
ආ) යාම යැදුම සරලව හඳුන්වන්න.
ඇ) එම ජන වන්දනාව යාම යැදුම ලෙස එය හඳුන්වන්නේ ඇයි?
ඈ) යාම යැදුමේ කාලයන් 04 ලියන්න.
ඉ) ශුද්ධ සභාවේ නිල යැදුම තුළින් ක්‍රියාවට නංවන්නේ කුමක්ද?

(12) යාම යැදුමේ පරමාර්ථය කුමක්ද? ඊට හේතුව කුමක්ද?

(13) අ) දිනපතා යාම යැදුම සිදු කරන්නේ කවුරුන්ද?

ආ) ගිහි සැදැහැවතුන්ගේ යාම යැදුම් වලින් එකක් නම් කරන්න.

(14) අ) දේව වන්දනාවේ (ජන වන්දනාවේ) අංග තුනටම සහභාගි විය යුත්තේ කෙසේද?

ආ) ජන වන්දනාවේ උතුම්ම පිළිවෙත වන දිව්‍ය පූජාවට සහභාගි විය යුත්තේ කෙසේද?

ඇ) ජන වන්දනාවේ තවත් අංගයක් වන දේව ප්‍රසාද නිධාන ලබා ගැනීමේ දී කිතුණු අප උනන්දු විය යුතු කරුණු 03ක් ලියන්න.

ඈ) යාම යැදුමට අප යොමු විය යුත්තේ කෙසේද?

ඉ) දෛනිකව කිතුනුවන් යාම යැදුමට සහභාගි වීමට නොහැකි වුවත්, ඒ සඳහා අපට ඒකාබද්ධ විය හැක්කේ කෙසේද?

(15) දේව වන්දනාවට අපි නිරතුරුව කැප වන්නේ කෙසේද?

(16) පාඩමේ අවසානයට සඳහන් වන ක්‍රියාකාරකම් යටතේ ඇති අංක 3 හා 4 ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

# දිව්‍ය පූජාව - 24 වන පාඩම

(01) අ) මෙම පාඩමේ ආරම්භයේ දී සඳහන් කරන ගීතිකාව ගායනා කරන්නේ කුමන අවස්ථාවේද?

ආ) මෙම ගීතිකාවෙන් ඇරයුම් කරන්නේ කුමකටද?

ඇ) එම ඇරයුමට ඔබ දක්වන ප්‍රතිචාර මොනවාද?

(මෙම ගීතිකාවේ කෝරස් එක හා පළමු පදය කට පාඩම් කර ගන්න)

(02)අ) කිතුනු ජීවිතයේ කේන්ද්‍රය වන්නේ කුමක්ද?

ආ) එය මගින් සුපරිස්මරණය(සිහි) කරන්නේ කුමක්ද?

ඇ) එය මගින් අපට සිදුවන්නේ කුමක්ද?

ඈ) එය මගින් ගොඩනැගෙන්නේ කුමක්ද?

(03) දිව්‍ය පූජාවේ පිළිවෙත් මොනවාද?

(04)අ) දිව්‍ය පූජාවේ ආරම්භක පිළිවෙත නැතහොත් එක්රැස්වීමේ පිළිවෙත සමන්විත වන්නේ කිනම් කොටස් වලින්ද?

ආ) දිව්‍ය පූජාවේ දේව වාක්‍ය පිළිවෙත සමන්විත වන්නේ කිනම් කොටස් වලින්ද?

ඇ) දිව්‍ය පූජාවේ පුදසුන සූදානම් කිරීමේ පිළිවෙත සමන්විත වන්නේ කිනම් කොටස් වලින්ද?

ඈ) දිව්‍ය පූජාවේ ස්තෝත්‍ර යාගික පිළිවෙත සමන්විත වන්නේ කිනම් කොටස් වලින්ද?

ඉ) දිව්‍ය පූජාවේ ධර්මදූත කාර්යය සඳහා පිටත් කර යැවීමේ පිළිවෙත තුළ සිදු වන්නේ කුමක්ද? සිදු විය යුත්තේ කුමක්ද? (එනම් අපට පැවරෙන වගකීම කුමක්ද?)

(05) පාඩමේ අවසානයේ සඳහන් වන ක්‍රියාකාරකම් වලින් අංක 3 හා 4 කරන්න.

# වෙනත් දේව වන්දනාත්මක ක්‍රියා - 25 වන පාඩම

(01) අ) වෙනත් දේව වන්දනාත්මක ක්‍රියා නැතහොත් මෙහෙයන් උපකාරි වන්නේ කුමක් ලබා ගැනීම සඳහා ද?

ආ) වෙනත් දේව වන්දනාත්මක ක්‍රියා සඳහන් කරන්න.

**<u>වෙනත් දේව වන්දනාත්මක ක්‍රියා වල විශේෂ ලක්ෂණ</u>**

(02)අ) එම ක්‍රියා ක්‍රියාත්මක කිරීමට නිල වශයෙන් බලය ඇත්තේ කා හටද?

ආ) එම ක්‍රියාවලින් දිගු කාලීනව වැදගත් වන්නේ කුමන ආශිර්වාදද?

ඇ) එම ආශිර්වාදයන් තුළ අඩංගු වී ඇති ක්‍රියාකාරකම් මොනවාද?

ඈ) එම ආශිර්වාදයන් තුළින් දානය කරනු ලබන්නේ කුමක්ද?

ඉ) එම ආශිර්වාද පිළිවෙත් පවත්වාගෙන යන්නේ කිනම් ආකාරයටද?

ඊ) එසේ පවත්වාගෙන යන වත් පිළිවෙත් කිහිපයක් නම් කරන්න.

(03) අ) ආශිර්වාද කිරීමේ පිළිවතේ සිදුවන්නේ කුමක්ද?

ආ) ඊට අඩංගු වන අවමංගල්‍ය පිළිවෙතින් සිදුවන්නේ කුමක්ද? එහි අරමුණ කුමක්ද?

(04) ශුද්ධවූ ධාතුවලට ගරු කිරීමේ පිළිවෙත දක්විය හැක්කේ කුමක් ලෙසින්ද?

(05) අ) පදක්කම් පැළඳවීමේ පිළිවෙත කිනම් ක්‍රියාවලියක්ද?

ආ) එහිදී අප නොකළ යුතු දේ කුමක්ද?

(06) අ) මෙම දේව වන්දනාත්මක ක්‍රියා නැතහොත් වත් පිළිවෙත් ඉවහල් වන්නේ කුමක් සඳහාද?

ආ) එම ක්‍රියා නැතහොත් වත් පිළිවෙත් තුළින් සිදු වන්නේ කුමක්ද?(කරුණු 2ක් ලියන්න)

ඇ) එම ක්‍රියා තුළින් දෙවියන් වහන්සේගෙන් අපට ලැබෙන්නේ කුමක්ද?

ඈ) එම ක්‍රියා පවත්වාගෙන යෑමට අප සිත්හි තබාගත යුතු කරුණ කුමක්ද?

(07) ඔබගේ කිතුනු ජීවිතයේදී ඔබ සතුවී ඇති වෙනත් දේව වන්දානාත්මක ක්‍රියා මොනවාද?

**(07)ო**

**(07)ග**

**(07)ම**

**(07)ო**

**(07)თ**

**(07)ල**